# ‘ගම්පෙරළිය’ සහ ‘කුමුදිනී’ (Yogayog) යන නවකතා ද්වයයෙන් පිළිබිඹු වන සමාජ පරිස්ථිතිය පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනයක්

එස්. එස්. කෞශල්‍යයා[1]

මාර්ටින් වික්‍රමසිංහගේ ‘ගම්පෙරළිය’ (1944) හා රබීන්ද්‍රනාත් තාගෝර්ගේ ‘කුමුදිනී’ (Yogayog, 1929) නවකතා ද්වයය මගින් යටත් විත පාලන සමයයෙහි ඒ රටවල ඇති වූ සමාජ පෙරළිය පිළිබිඹු වන අයුරු විමර්ශනය කිරීම මෙහි අරමුණ වේ. යටත් විජිත පාලන සමයයෙහි සිදු වූ වාණිජවාදයේ නැඟීම සහ වෙළෙඳ කුලයේ ස්ථාපිත වීමත් සමඟ සමාජයේ එකට ගැටෙන පන්තීන් බිහි වීම, වෛවාහක සම්බන්ධතා මගින් පෙරදිග කාන්තාව මුහුණ පෑ තත්ත්වය යනාදිය කෙරෙහි මෙහි දී අවධානය යොමු කෙරේ. එකිනෙක ගැටෙන සමාජ පන්ති දෙකක් අතර සිදු වන විවාහයක දී කුල සිරිත්වලින් දැඩි හික්මීමක් ලද කාන්තාව කුටුම්බය ආරක්ෂා කරගනු වස් තම ආධ්‍යාත්මය සකසාගන්නා අයුරු මෙකී කෘති මගින් නිරූපණය වන බව නිරීක්ෂණය කළ හැකි ය. බෞද්ධ ආභාසයක් ලද ලාංකේය සමාජ යථාර්ථයත් හින්දු ආභාසය ලද භාරතීය සමාජ යථාර්ථයත් ‘ගම්පෙරළිය’ හා ‘කුමුදිනී’ යන කෘතිවලින් ප්‍රකට කෙරේ. මෙහි දී ලාංකේය අනන්‍යතාවක් ඇති සමාජ, ආර්ථික, සංස්කෘතික යථාර්ථය භාරතීය අනන්‍යතාවක් ඇති සමාජ, ආර්ථික, සංස්කෘතික යථාර්ථය අතර යම් යම් වෙනස්කම් පැවතුණ ද මේ සමාජ දෙක ම පෙළනු ලැබූයේ තත්කාලීන සමාජයේ ක්‍රියාත්මක වූ වාණිජත්වය විසිනි. මේ අධ්‍යයනය සඳහා මාර්ටින් වික්‍රමසිංහගේ ‘ගම්පෙරළිය’ නවකතාව සහ රබීන්ද්‍රනාත් තාගෝර් ‘Yogayog’ නමින් රචනා කරන ලදු ව ආනන්ද අමරසිරි විසින් සිංහලයට පරිවර්තනය කරන ලද ‘කුමුදිනී’ නවකතාව මූලාශ්‍රය කොටගැනේ. මේ නවකතා සංසන්දනාත්මක ව අධ්‍යයනය කිරීමේ දී ‘ගම්පෙරළිය’ මෙන් ම ‘කුමුදිනී’ ද නව වාණිජවාදී ධනේශ්වර සමාජ ක්‍රමයක ප්‍රතිඵල භුක්ති විඳි සමාජයන් වශයෙන් නිරූපණය වන බව හඳුනාගත හැකි අතර ඒ ඒ දේශයන්ට අනන්‍ය සාධාරණ ලක්ෂණ මෙන් ම එකී සමාජ පද්ධතීන්හි පවතින සම විෂමතා ද මේ නවකතා ද්වයයෙහි පිළිබිඹු වන බව නිරීක්ෂණය කළ හැකි ය.

**ප්‍රමුඛ පදඃ** ගම්පෙරළිය, කුමුදිනී, යටත් විජිතකරණය, ධනවාදයේ නැඟීම, සමාජ යථාර්ථය

[1] සිංහල අධ්‍යයනාංශය